**ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 අගෝස්තු 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 සැප්තැම්බර් 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) (i ) | සංස්කෘතික අංශය සතු වාහන 03 ක් මූල්‍ය ප්‍රකාශන තුළ වාහනවල වටිනාකමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | 1.6.1 (ආ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i ) | 2023 අයවැය ඇස්තමේන්තුව අනුව, වැඩසටහන් 01ට අදාළ පුනරාවර්තන වියදමෙහි ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.553,000,000ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයෙහි වැඩසටහන් අනුව වියදම් සාරාංශයේ (ඒසීඒ-2) ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.553,344,600ක් ලෙස රු.344,600ක් වැඩියෙන් දක්වා තිබුණි. | සංස්කෘතික සහ ජාතික උරුම අංශ අතර ප්‍රතිපාදන මාරුකිරීම් ජාතික උරුම අංශය විසින් මු.රෙ. 66 අනුව මාරු කිරීම් ලෙස සටහන් කිරීම හා එය එලෙසම අවසන් මූල්‍ය වාර්තාවේ ද සටහන්වීම මෙයට හේතු වී ඇති බවත් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම අඩුපාඩු වළක්වා ගැනීමට පියවර ගන්නා බවත් දන්වා තිබුණි. | නිවැරදි දත්ත ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | 101-1-03 හි 1201, 1401 සහ 1301 වැය විෂයයන් යටතේ පිළිවෙලින් රු.100,000ක්, රු.800,000ක් හා රු.555,400ක් මු.රෙ.66 මාරුකිරීම් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ 2, ඒසීඒ2(i) හා ඒසීඒ2(ii) හි දක්වා තිබුණ ද මු.රෙ.66 යටතේ එවැනි මාරුකිරීම් සිදු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ජාතික උරුම අංශයේ ප්‍රතිපාදන ඉතිරිවීම හා සංස්කෘතික අංශයට ප්‍රතිපාදන මදිවීම මත එම වැය විෂයය යටතේම අභ්‍යන්තරව ප්‍රතිපාදන මාරුකිරීමක් සිදු කරන ලද බවත් ඒ අනුව මෙය වැය විෂයය අංක අතර හුවමාරුවක් නොවන බැවින් මු.රෙ. 66 යටතේ අධිකාරි බලය අවශ්‍ය නොවූ බවත් දන්වා තිබුණි. | නිවැරදි දත්ත ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |
| (iii) | CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම සහ නව CIGAS වෙබ් යෙදුම් පද්ධතිය මඟින් ලබා ගත් ශේෂ පිරික්සුම අනුව අමාත්‍යාංශය වෙනුවෙන් වෙනත් ආයතන විසින් දරන ලද වියදම රු.355,187,750ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ රු.355,243,510ක් ලෙස රු.55,760ක් වැඩියෙන් දක්වා තිබුණි. | අමාත්‍යාංශය විසින් 2023 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය ඒසීඒ 2(i) හි මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු දරන ලද වියදම් යටතට නොගැනෙන රු.55,760ක් සටහන්වීම මෙයට හේතු වී ඇති බවත් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම අඩුපාඩු වලක්වා ගැනීමට පියවර ගන්නා බවත් දන්වා තිබුණි. | නිවැරදි දත්ත ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |
| (iv) | ජාතික උරුම අංශය විසින් දරන ලද වියදම් වැය ලෙජරයේ සටහන් නොකිරීම හේතුවෙන් ජාතික උරුම අංශයේ ශේෂ පිරික්සුමෙහි එම වියදම් සටහන් නොවූවද භාණ්ඩාගාර මුද්‍රිතවල එම වියදම් සටහන් වී ඇති අතර ජාතික උරුම අංශයේ ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර ශේෂ පිරික්සුම අතර වෙනස මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-2(i)හි මු.රෙ.208 යටතේ | ජාතික උරුම අංශය යටතේ සම්බන්ධීකරණය වන ආයතන කිහිපයක සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා වෙන්වන ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් නිදහස් කර ගැනීම හා එම ප්‍රතිපාදන යටතේ මාසිකව වියදම් දරන ලද ආකාරය පිළිබඳ තොරතුරු ජාතික උරුම අංශය වෙත යොමු නොවන බැවින් එය වැය ලෙජරයේ සටහන් නොවේ. එහෙත් එම ආයතන සෘජුවම භාණ්ඩාගාරය වෙත යොමු කරනු ලබන දත්ත අනුව වියදම් ඇතුළත් කරනු | අමාත්‍යාංශය වෙනුවෙන් වෙනත් ආයතන දරනු ලබන වියදම් ද වැය ලෙජරයේ සටහන් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් ලෙස සටහන් කර තිබූ අතර එහි වටිනාකම රු.106,900,759ක් විය. | ලබන බැවින් මූල්‍ය ප්‍රකාශනයේ සහ වැය ලේජරයේ වියදම් පිළිබඳ වෙනසක් පෙන්වීමට හේතු වී ඇති බවත් 2024 වර්ෂයේදී භාණ්ඩාගාර දත්ත හා ජාතික උරුම අංශයේ දත්ත සමානව ඇතුළත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ගැනීමට සටහන් කර ගත් බවත් දන්වා තිබුණි. | |
| (**v**) | ජාතික උරුම අංශය විසින් පවත්වාගෙන යන වැය ලෙජරයේ වැඩ සටහන් 2 හි ව්‍යාපෘති 09 ට අදාළව වැය විෂයයන් 05ක ඉතිරිය රු.27,808,451ක් ලෙස දක්වා තිබුණ ද එය මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ-2(ii) හි රු.37,871,240ක් ලෙස රු.10,062,789ක් වැඩියෙන්ද පුනරාවර්තන වැය විෂයයන් 2 ක ඉතිරිය රු.22,693,425ක් ලෙස වැය ලෙජරයේ දක්වා තිබුණ ද එය මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ-2(ii) හි රු.13,982,922ක් ලෙස රු.8,710,503ක් අඩුවෙන් ද එක් මූලධන වැය විෂයයකට අදාළව ඉතිරිය රු.10,992,468ක් ලෙස වැය ලෙජරයේ දක්වා තිබුණ ද එය මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ-2(ii) හි රු.2,992,469ක් ලෙස රු.7,999,999ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2023 වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් සියයට 15ක් කපා හැරීමට ලබාදී තිබූ උපදෙස් පරිදි එම ප්‍රමාණයක් කපා හැර ජාතික උරුම අංශයේ වැය ලෙජරයේ අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. එමෙන්ම 101-2-9-004-1503 වැය විෂයයට අදාළ ගෙවීම් වවුචර්, 101-2-9-020-1409 වැය විෂයයට අදාළව ඉදිරිපත් වූ ප්‍රතිපාදන නිදහස් කිරීම් හා 101-2-9-20-2509 වැය විෂයයට අදාළ යොමුවන ගෙවීම් වවුචර් පත් පමණක් වැය ලෙජරයේ සටහන් කරනු ලබන අතර අනෙකුත් වියදම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා සිදුවන බැවින් ඒ සම්බන්ධයෙන් සෘජුවම භාණ්ඩාගාරය වෙත යොමු කරනු ලබන දත්ත අනුව මූල්‍ය ප්‍රකාශනයට වියදම් ඇතුළත් කර ඇති බවත් ඒ අනුව වැය ලෙජරයේ සහ මූල්‍ය ප්‍රකාශනයේ දත්ත අතර වෙනසක් පෙන්වීමට හේතු වී | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |

ඇති බවත් දන්වා තිබුණි.

**(ආ) දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ නමින් ලියාපදිංචි කර තිබූ වාහන 02 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | අදාළ වාහන 02 භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ පවතින අතර අළුත්වැඩියා කර තක්සේරු කිරීමෙන් පසු මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු බව දන්වා තිබුණි. | අමාත්‍යාංශයට අයත් සියළු මූල්‍ය නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 02ක් හා මූලධන වැය විෂයයන් 06ක් සඳහා ප්‍රතිපාදිත රු.109,563,6ක් වූ ප්‍රතිපාදනයෙන් රු.89,064,964ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය සියයට 76 සිට සියයට 98ත් අතර විය. | අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වියදම් සීමා කිරීමත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් අක් මුදල් නිදහස් කර ගැනීමේ අවිනිශ්චිතතාවය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කල් දැමීමත්, ඇතැම් ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර අනුමැතිය නොලැබීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | ප්‍රතිපාදන අවශ්‍යතා තීරණය කිරීමට ප්‍රථමයෙන් ඒ සඳහා පවතින ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් නිශ්චය කර ගත යුතුය. |
| (ආ) | වැය විෂයය අංක 101-2-06-1409 (8) යටතේ ආගමික කටයුතු නඟා සිටුවීම සඳහා වූ රු.මිලියන 22න් රු.මිලියන 5ක් | 2023 වර්ෂයේ වෙසක් උත්සවය වෙනුවෙන් වෙන් වී තිබූ ප්‍රතිපාදනය රු.මිලියන 5ක් වූ අතර එම මුදල් වෙසක් | ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරීමට වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන අදාළ කාර්යභාරයන් ඉටු කරීම සඳහා උපයෝජනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයක් සඳහා මාරු කර තිබුණු අතර රු.මිලියන 10.18ක් ඉතිරි කර තිබුණි. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60ක් විය. මේ අනුව අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් වන ආගමික කටයුතු නංවාලීම සඳහා වෙන් කරන ලද රු.මිලියන 22 න් අපේක්ෂිත අරමුණ වෙනුවෙන් වැය කර තිබුණේ රු.මිලියන 6.82ක් පමණක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 31 ක් විය. | උත්සවයේ වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් ආගමික කටයුතු නංවාලීමේ වැය විෂයයෙන් රාජ්‍ය වෙසක් උත්සවයේ විවිධ වියදම් සිදුකිරීම සඳහා රු. මිලියන 5ක මුදලක් මු.රෙ. 66 මගින් මාරු කර ඇති බව දන්වා තිබුණි. | |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට රු.3,460,832ක් ගෙවීමට ඇති බවට එම දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා තිබුණ ද, එහි නිවැරදිතාවය පිළිබඳ තහවුරු කරගෙන එම මුදල් නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදාළ තහවුරු කර ගැනීම් සිදු කරමින් පවතින බවත් නොපමාව ගෙවීම් අවසන් කිරීමට පියවර ගන්නා බවත් දන්වා තිබුණි. | අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් නිවැරදිතාවය තහවුරු කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|

| | | |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සමාලෝචනයක් සිදු කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බව දන්වා තිබුණි.<br><br>කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක DMA/06 හා 2011.12.23 දින දරන "අභ්‍යන්තර පාලන ව්‍යුහය ඇගයීම සම්බන්ධ මාර්ගෝපදේශය" මැයෙන් වන චක්‍රලේඛය හා ඊට අදාළවන අනෙකුත් චක්‍රලේඛ විධිවිධාන අනුව සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගෙන යනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **(i)XXIV** වැනි පරිච්ඡේද යේ 4.4 උප වගන්තිය | 361,844 | සේවයේ යෙදී සිට මිය ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ වර්ෂ 01 සිට 20 දක්වා කාලයක සිට පැවත එන රු.361,844ක හිඟ ණය ශේෂ අය කර නොතිබුණි. | සංස්කෘතික කටයුතු අංශයේ මියගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ මේ සඳහා අදාළ වේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| | **(ii)XXIV** වැනි පරිච්ඡේද යේ 4.5, 4.6 සහ 6.3 උප වගන්ති | 869,637 | සංස්කෘතික අංශයේ වැඩ තහනම් කරන ලද නිලධාරීන් 11 දෙනෙකුගේ වර්ෂ 1 සිට 20 දක්වා කාලපරාසයක සිට පැවති හිඟ ණය ශේෂ එකතුව වූ රු.666,790 ක් අය කර නොතිබුණි. තවද, වසර 10-20 අතර කාලපරාසයක සිට පවතින විශ්‍රාමික නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.128,732ක ණය ශේෂයක් හා සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු වසර 01–03 අතර කාලපරාසයක සිට පවතින එකතුව රු.74,115ක් වූ ණය ශේෂයන් ද සමඟින් රු.202,847ක් විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතුව පැවතුණි. | වර්ෂ 09කට වැඩි කාලයක සිට හිඟ ණය ශේෂ සහිත සංස්කෘතික අංශයේ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 11 දෙනෙක් පමණක් සිටින බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | 367,450 | ලිපිද්‍රව්‍ය හා කාඞ්බෝඞ් අස්ථානගතවීම සම්බන්ධයෙන් | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(3) හා (4) | | ප්‍රාරම්භක වාර්තාවක් සහ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අලාභය අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | - | අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයට අදාළ වාහන සංචිතයේ 16ක් වූ සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.5 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 02 ඉක්ම වූ රු.21,106,115ක කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් තැන්පතු 05ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. කල් ඉකුත් වූ සියලු තැන්පත් පිළිබඳව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුවත් එවැනි ලැයිස්තුවක් පිළියෙල කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු විද්‍යාලංකාර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ගෙවිය යුතු තැන්පතු වන අතර ඉදිකිරීමට අදාළ නිවැරදි කිරීම් සිදු කරන තෙක් අත රැඳවුම් නිදහස් කිරීම තාවකාලිකව නවත්වන ලෙස අමාත්‍යාංශයේ ඉංජිනේරු විසින් නිර්දේශ කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 නොවැම්බර් 27 දින මිල්ලනිය සංස්කෘතික මධ්‍යස්ථානය නමින් ඇති බැංකු ගිණුමට එකවර රු.400,000ක මුදලක් තැන්පත් කර තිබීම නිසා | අදාළ කාලසීමාව තුළ ස්ථානභාර නිලධාරියා සේවය හැරයාම නිසා පරීක්ෂණවලට සහභාගී කර ගත නොහැකිවීම මත පරීක්ෂණ ප්‍රමාද වී ඇති බව දන්වා තිබුණි. | මුදල් පොත නිවැරදිව පවත්වා ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| එදිනට බැංකු ශේෂය රු.402,684ක් වී තිබුණද, මුදල් පොත අනුව ශේෂය රු.18,592 ක් පමණක් වීමත්, රු.400,000ක මුදල ලැබුණු ආකාරය පිළිබඳ ලිඛිත සාක්ෂි නොවීමත් හේතුවෙන් මුදල් පොත නිවැරදිව පවත්වාගෙන ගොස් නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර අවස්ථා 10 ක දී රු.400,000ක මුදල නැවත බැංකු ගිණුමෙන් ලබා ගෙන තිබුණද, එම මුදල් යෙදවූ ආකාරය පිළිබඳව තොරතුරු ද විගණනයට අනාවරණය නොවීය. | | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මට අනුව පාහියංගල මානව ඇටසැකිලි සංරක්ෂණ කුටි සඳහා උෂ්ණත්වය පාලන යන්ත්‍රයක් මිලට ගැනීම සඳහා වාර්ෂික අයවැය මඟින් රු.මිලියන1.2ක් වෙන් කර, 2023 වර්ෂයේ අගෝස්තු මස අවසන් වන විට එම යන්ත්‍රය ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමට සැලසුම් කර තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාව අනුව මෙම යන්ත්‍රයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | උෂ්ණත්ව පාලන යන්ත්‍රයක් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමේ කාර්යය සඳහා කටයුතු කළ හැකි ආයතන සොයා ගැනීමට අපහසු වීම හේතුවෙන් නියමිත සැලැස්ම අනුව අවසන් කිරීමට නොහැකි විය. එසේ වුවද, එම ප්‍රමාදය හේතුවෙන් පුරාවස්තු සංරක්ෂණ ක්‍රියාවලියට අයහපත් බලපෑමක් ඇතිවීම වැළැක්වීම සඳහා එම පුරාවස්තු ඉතාමත් සුරක්ෂිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ තැන්පත් කර මේ වන විට එය කොළඹ ජාතික කෞතුකාගාරයේ වායු සමීකරණය කරන ලද ගැලරියක විශේෂිත වීදුරු කුටියක් තුළ තැන්පත් කර ඇති බවත් උෂ්ණත්ව පාලන යන්ත්‍රය සවිකිරීමට නියමිත බවත් දන්වා තිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම අනුව අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුද්ධශාසන අංශයේ කාර්යසාධන වාර්තාවෙහි අනුකූලතා වාර්තාව අනුව අමාත්‍යාංශය විසින් අනුකූල වී නොමැති අවශ්‍යතා 07ක් අනුකූල වන බව වාර්තා කර තිබුණි. | එක් කරුණක් හැර අනෙක් කරුණු සඳහා අනුකූල නොවන බව පිළිගන්නා බව සඳහන් කර ඒ අනුව කාර්යසාධන වාර්තා කෙටුම්පතද මේ වන විට යාවත්කාලීන කර ඇති බව දන්වා තිබුණි. | පිළිතුර සාවද්‍ය වේ. කාර්යසාධන වාර්තාවට නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සංස්කෘතික අංශයේ කාර්යසාධන වාර්තාවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක් සංස්කෘතික මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමට කටයුතු කර ඇති බව සඳහන්ව තිබුණද, මුලතිව්, මන්නාරම් හා කිලිනොච්චි යන දිස්ත්‍රික්ක තුන තුළ එකදු සංස්කෘතික මධ්‍යස්ථානයක් හෝ ස්ථාපිත කර නොතිබුණු අතර සියලුම වැඩසටහන්වල භෞතික ප්‍රගතිය සියයට 2 සිට සියයට 38 දක්වා වුවද, කාර්යසාධන වාර්තාවේ සියයට 53 සිට සියයට 100 දක්වා භෞතික ප්‍රගතියක් ලබා ගෙන ඇති බව සඳහන් කර තිබුණි. | පවත්නා රාජ්‍ය වියදම් චක්‍රලේඛ යටතේ නව ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකළ බැවින් අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි ගොඩනැගිලි තිබේ ද යන්න පිළිබඳ තොරතුරු විමසා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉල්ලීම් ලිපි යවා ඇත . ඒ අනුව අදාළ දිස්ත්‍රික්කවල පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ද සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කළ හැක. ඉහත චක්‍රලේඛ නිකුත් කිරීමට ප්‍රථමව ප්‍රතිපාදන ලබා දුන් ඕමන්තේ, සන්දිලිප්පායි, මරුදන්කර්නි යන සංස්කෘතික මධ්‍යස්ථානවලද සියලු ඉදිකිරීම් කටයුතු අවසන් කර මේ වන විට පාඨමාලා ද පවත්වාගෙන යනු ලබන බව දන්වා තිබුණි. | කාර්යසාධන වාර්තාවට නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම නොවන වත්කම් ශේෂයේ ඇතුළත් තක්සේරු වටිනාකම රු.120,000ක් වූ මෝටර් රථයක් 2019 වර්ෂය හෝ ඊට පෙර සිට මහානායක චාරිකාරාම පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් පැවති අතර 2022 ඔක්තෝබර් 27 දින මෙම රථය අපහරණය සඳහා තීරණය කර ඇතත් මෙතෙක් අපහරණය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි මෝටර් රථ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අමාත්‍යාංශයට අයත් වාහන 02 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතුණු අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | වාහන නිකරුනේ ගාල් කර තැබීමෙන් තොරව අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2019 මාර්තු 31 දිනට පෙර රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳව ගැටළු නිරාකරණය කර ගත යුතු වුවද අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන 03ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කර මෙම වාහන කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වාහන පරිහරණය සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන තිබූ සංස්කෘතික අංශය සතු වාහන 02 ක් නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල පිහිටි රථ ගාලක අනාරක්ෂිතව ගාල් කර තිබූ අතර එම වාහන සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13.2 ඡේදයට අදාළ වන මාර්ගෝපදේශ අංක 3 හි සඳහන් ක්‍රමවේදය අනුව කටයුතු කර නොතිබුණි. | එක් රථයක් සංස්කෘතික කටයුතු අංශය මඟින් අපහරණය කිරීමට කටයුතු කළ ද රජයේ තක්සේරු මුදලට ලංසු ඉදිරිපත් නොවීම හේතුවෙන් නැවත අඩු මුදලතට අපහරණය කිරීමට බලාපොරොත්තු වන අතර මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා පරීක්ෂා කළ ද අනෙක් රථයේ චැසි අංකය සොයා ගත නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අමාත්‍යාංශය යටතේ පාලනය වන රජරට චාරිකා නිවාසය පිහිටි ඉඩම හා එම ගොඩනැගිල්ල අමාත්‍යාංශය යටතට පවරා ගෙන නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් යටතට ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කර ගත් බව දන්වා තිබුණි. | අදාල වත්කම් අමාත්‍යාංශය යටතට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ |
| (ඊ) | නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය විසින් 2005 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර අඩක් නිම කර තිබූ වර්ග මීටර් 9847 ක වපසරියකින් යුත් විද්‍යාලංකාර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව 2013 වර්ෂයේදී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පැවරීතිබූ අතර 2019 වර්ෂයේදී රු.මිලියන 1249.93 ක වියදමකින් වැඩ අවසන් කර තිබුණි. 2017 වර්ෂයේදී වැඩ නිම කිරීමට නියමිතව තිබියදී 2019 වර්ෂයේදී වැඩ නිම කර තිබූ අතර ගොඩනැගිල්ල අමාත්‍යාංශය වෙත භාර ගැනීම 2021 වර්ෂය දක්වා ප්‍රමාද වී තිබුණි.ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට වර්ෂ දෙකකට අධික කාලයක් ප්‍රමාද වී තිබුණද ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ඉදිකිරීමෙහි පැවති අඩුපාඩු සහිතව ගොඩනැගිල්ල විද්‍යාලංකාර භාරය වෙත පැවරීමට කටයුතු කර තිබුණද අදාළ භාරය විසින් විධිමත්ව භාර ගත් බවට ලිඛිත සනාථ කිරීමක් සිදු කර නොතිබුණි. තවදුරටත් මෙම වාර්තාවේ දිනය වන විටත් මෙම ගොඩනැගිල්ල කිසිදු ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ප්‍රමාද වීමට හේතු වූ කරුණු සියල්ල සලකා බලා, ව්‍යාපෘතියේ ප්‍රමාද ගාස්තු ගණනය කර රැඳවුම මගින් ප්‍රමාද ගාස්තු අය කිරීම කෙරෙහි සලකා බැලීමට තීරණය කර ඇති අතර ගොඩනැගිල්ල ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යෙදවීමට අවශ්‍ය සැලසුම් කටයුතු සිදු කරමින් පවතී. | ප්‍රමාද කාලය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමටත් ගොඩනැගිල්ල ඵලදායී කාර්යයකට යොදවා ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ | නිර්දේශය |
|---|---|---|

| | අදහස් දැක්වීම | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරියෙකු එකී තනතුරට පත් කළ දිනයේ සිට හෝ එවැනි තනතුරකට මාරු කළ දිනයේ සිට දෙමසක් ඇතුළත ඇප තැබීම කළ යුතු වුවත් බුද්ධශාසන අංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 25 දෙනෙකුගෙන් ඇප මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන පරිපාලනය, නඩත්තුව හා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සංස්කෘතික අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන මෙහෙයුම් කාර්යයක් වුවද, සමස්ත ලංකා සංස්කෘතික මධ්‍යස්ථාන ස්ථානභාර නිලධාරීන්ගේ වෘත්තීය ගැටළු හේතුවෙන් 2023 ප්‍රතිභා ජාතික තරඟාවලිය සඳහා තේරී පත් වී තිබුණු මධ්‍යස්ථාන 130 න් මධ්‍යස්ථාන 66 ක සිසුන් ඒ සඳහා සහභාගී වී නොතිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 51 කි. | වෘත්තීය ගැටළුවක් නිසා වර්ජනයකට සහභාගී වන බව වෘත්තීය සමිති විසින් අමාත්‍යාංශය දැනුවත් කර නොතිබුණි. එවැනි තත්ත්වයක් මත පළාත් තරඟ නිසි පරිදි පවත්වා නිම කර නියමිත දිනට සමස්තලංකා තරඟ පැවැත්වීමට චක්‍රලේඛ නිකුත් කර ඇත. ඒ අනුව නිසි පරිදි පළාත් තරඟ පවත්වා සමස්තලංකා තරඟ පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදි. | සංස්කෘතික මධ්‍යස්ථාන පරිපාලනය, නඩත්තුව හා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සහ අදාළ තරඟාවලි නියමිත පරිදි පැවැත්වීම නිසි පරිදි සිදු කළ යුතු වේ. |
| (ආ) | සංස්කෘතික මධ්‍යස්ථානයේ මාසික ලැබීම් හා ගෙවීම් සාරාංශය අදාළ මාසය අවසන් වී ඊළඟ මාසයේ 5 වෙනි දිනට ප්‍රථමයෙන් පර්යේෂණ, අධීක්ෂණ හා විමර්ශන අංශයට එවිය යුතු වුවත් දිවයිනේ පිහිටි 215 ක් වන සංස්කෘතික මධ්‍යස්ථානවලින් මධ්‍යස්ථාන 114 ක් එනම් සියයට 53 ක් මාසික සාරාංශ ඉදිරිපත් කිරීමට කටයුතු කර | නිවැරදි කෙරෙමින් පවතී . | සංස්කෘතික මධ්‍යස්ථානවල මාසික ලැබීම් හා ගෙවීම් සාරාංශ අදාළ කාලසීමාවන් ඇතුළත ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2014 ජුනි 26 දිනැති අංක 5 /2014 දරන සංස්කෘතික හා කලා කටයුතු චක්‍රලේඛයේ 7 උපවගන්තිය අනුව සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධන සංගමයේ ගනුදෙනු පරීක්ෂා කිරීම සඳහා ගණන් පරීක්ෂකවරයෙකු වශයෙන් ආසන්න සංස්කෘතික මධ්‍යස්ථානයක ස්ථානභාර නිලධාරී, සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී හෝ සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී යන අය අතුරින් තෝරාගත් අයෙකු පත්කර ගත යුතු අතර එසේ නොමැති අවස්ථාවල දී ප්‍රදේශයේ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක ක්ෂේත්‍රයට අදාළ නිලධාරියෙකු පත් කර ගත යුතු වුවද, 2020 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2024 පෙබරවාරි 28 දින වන තෙක් සංස්කෘතික මධ්‍යස්ථානයට ගණන් පරීක්ෂකවරයෙකු පත් කර ගෙන නොතිබුණි. | නිවැරදි කෙරෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව සංස්කෘතික මධ්‍යස්ථානවල ගණන් පරීක්ෂකවරු පත් කළ යුතුවේ. |
| (ඈ) | උක්ත චක්‍රලේඛයේ 16 වන උප වගන්තිය අනුව මධ්‍යස්ථානයේ සංවර්ධන සංගමය විසින් කාරක සභා රැස්වීම් පවත්වා නොතිබුණු අතර 20 උප වගන්තිය අනුව ආදායම් හා වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම ද සිදු කර නොතිබුණි. ඒ පිළිබඳව අමාත්‍යාංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබීම හේතුවෙන් ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම අධීක්ෂණයකින් හා පාලනයකින් තොරව මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරියාගේ අභිමතය පරිදි සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. | නව ස්ථාන භාර නිලධාරියෙකු පත්කර ඇති අතර කාරක සභා රැස්වීම් ද පවත්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව සංස්කෘතික මධ්‍යස්ථානවල කාරක සභා රැස්වීම් පැවැත්වීමට හා ආදායම් හා වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ක්‍රියා කළ යුතු වේ. |
| (ඉ) | ගොඩනැගිලි හා අනෙකුත් පහසුකම් සහිත වඩාත් ඵලදායි අයුරින් ආදායම් උත්පාදන කාර්යය සඳහා යොදා ගැනීමේ හැකියාව පවතින අපේ ගම පරිශ්‍රය වාණිජ ස්වරූපයෙන් පවත්වා | මේ වන විට මුදල් උත්පාදනය සඳහා කළමනාකරණ හා මූල්‍ය ක්‍රමවේද ඇතුළත් ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් සකස් | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි අපේ ගම පරිශ්‍රය ආදායම් උත්පාදන කාර්යයන් සඳහා යොදා ගැනීමට සහ උපරිම |

| | | | |
|---|---|---|---|
| | ගත හැකි කටයුතු සඳහා ප්‍රතිපාදන සලසා දීමේ හැකියාවක් නොමැති බැවින් වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යන ව්‍යාපෘතියක් සමග ඒකාබද්ධව හෝ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාමට පියවර ගත යුතු බව 2021 නොවැම්බර් 02 දිනැති අංක අමප/21/1883/305/007-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රකාශ කර තිබුණද වසර 02 ක කාලයක් ඉක්මවා තිබියදීත් ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගෙන නොතිබුණි. තවද, වසරකට වැඩි කාලයක සිට අහිමිව තිබුණු නරඹන්නන් සඳහා ටිකට්පත් අලෙවි කිරීමෙන් ආදායම් උපයා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබීමෙන් පරිශ්‍රයේ ඇති ගොඩනැගිලි ආකෘති හා මිනිස් රූප විනාශ වෙමින් පැවතීමත් 46 ක් පමණ වන වෙළඳ කුටිවලින් කුටි 25ක පමණ නිෂ්පාදන අලෙවිකරුවන් නොමැතිව ඌණ උපයෝජිතව පැවතීමත් යන කරුණු අනුව අපේගම පරිශ්‍රය ඌණ උපයෝජිත තත්ත්වයේ පැවතුණි. | කර එය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.<br><br>පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේ ගම පරිශ්‍රය නරඹන්නන් සඳහා වසා දමා තිබුණ අතර එම තත්ත්වය 2022 වර්ෂයේ අවසාන භාගය දක්වාම පැවතුණි. එම කාලය තුළ පරිශ්‍රයේ නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වූ බැවින් පරිශ්‍රයේ බොහෝ නැරඹුම් ස්ථාන ස්වභාවික හේතු හා තත්ත්වයන් මත විනාශ වී තිබුණි. | උපයෝගීතාවයකින් යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් අයකරන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව ගාස්තු සංශෝධනය කළ යුතු වුවද, අපේ ගම පරිශ්‍රයේ වෙළඳ කුටි සඳහා අයකරනු ලබන ගාස්තු එලෙස සංශෝධනය කර නොතිබුණි. | වෙළඳ කුටි ගාස්තු සංශෝධනයට අදාළව මේ වන විට කටයුතු සිදුකර ඇත. වෙළඳ කුටි නඩත්තුවට යන වියදම, වෙළඳ කුටියේ ප්‍රමාණය හා ඒ වෙනුවෙන් සපයා ඇති යටිතල පහසුකම් මත පදනම්ව මාසික ගාස්තුවක් අයකිරීමටත්, ඊට අදාළව ද්විපාර්ශවික ගිවිසුමක් මත වෙළඳ කුටි ලබාදීමටත් අවධානය යොමු කරමින් එම කටයුතු පිළිබඳ සාකච්ඡා කර තීරණයකට එළඹීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළ අතර, | චක්‍රලේඛ ප්‍රකාරව ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

එම කමිටුවේ නිර්දේශ අනුව අදාළ ගාස්තු වැඩිවීම සියයට 15 උපරිමය ඉක්මවා තිබූ හෙයින් අනුමැතිය ලබාගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.